# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජනවාරි 2018

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

---

මෙවර ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රයට උත්තර සැපයීමේදී අයදුම්කරුවන්ගෙන් බහුතරයක් සතුටුදායක මට්ටමින් සාර්ථකව උත්තර සපයා ඇති බව දක්නට ලැබුණි. එසේ වුවද සමස්තයක් ලෙස ගත්කල සමහර ප්‍රශ්න සඳහා බොහෝ අයදුම්කරුවන් සපයා තිබූ උත්තර වල යම් යම් අඩුපාඩුකම් තිබූ බව පැහැදිලි විය. ඒ පිළිබඳව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයන් පහත දැක්වේ:

## <u>A - කොටස</u>

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

සමස්තයක් ලෙස විෂය නිර්දේශයෙහි පුළුල් පරාසයක් ආවරණය වන පරිදි මුළු ලකුණු ප්‍රමාණයෙන් 40% ක් සඳහා මෙම කොටස සකස් වී තිබුණි. මූලික ආර්ථික විද්‍යාත්මක න්‍යායයන් සහ සංකල්ප පදනම් කරගනිමින් විෂය නිර්දේශයෙහි බර තැබීම්වලට ගැලපෙන අයුරින් මෙය සැකසී තිබුණි. ප්‍රශ්න අංක 1.1 සිට 1.10 දක්වා දෙන ලද වරණයන් අතුරින් නිවැරදි වරණය තේරීමත් ප්‍රශ්න අංක 1.11 සිට 1.15 දක්වා යම් න්‍යායාත්මක ප්‍රකාශයක් දී එහි සත්‍ය අසත්‍ය බව දැක්වීමටත් ප්‍රශ්න අංක 1.16 සිට 1.20 දක්වා දෙනලද උත්තර දෙකක් අතුරින් නිවැරදි උත්තරය තෝරා හිස්තැන පිරවීමටත් යන සරල ආකෘතියක් යටතේ මෙම ප්‍රශ්නය සකස්කර තිබුණි.

මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් සාර්ථක ලෙස උත්තර සපයා සාධනීය මට්ටමකට ලකුණු ලබා තිබූ බව පෙනුණි. කෙසේවෙතත් මෙම කොටසේ සමහර ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගේ උත්තරවල අඩුපාඩු නිරීක්ෂණය විය.

දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුනු වැරදි / දුර්වලතා කිහිපයක් පහත දැක්වේ:

1.1 මිනිස් අවශ්‍යතා සහ වුවමනා සපුරාලීමට සම්පත් සීමිතව තිබීම, ආර්ථික විද්‍යාවේ පදනම ලෙස සළකන "හිඟකම" ලෙස බහුතරයක් අයදුම්කරුවන් නිවැරදිව උත්තර සපයා ලකුණු දෙකක් ලබාගෙන ඇත. නමුත් සමහර අයදුම්කරුවන් එය "ආවස්ථික පිරිවැය" ලෙස වැරදියට දක්වා තිබූ අවස්ථාද දක්නට ලැබුණි.

1.2 උපේක්ෂා වක්‍ර විග්‍රහය සම්බන්ධයෙන් දී තිබූ මෙම පරීක්ෂා කිරීමට ප්‍රශ්නයෙහි දී ඇති ලක්ෂණ සියල්ලම නිවැරදි ලෙස බොහෝ අයදුම්කරුවන් සාර්ථකව උත්තර දී ඇත. නමුත් සමහර අයදුම්කරුවන් දී ඇති උත්තර සියල්ලම නිවැරදි බව තේරුම් නොගැනීමෙන් වැරදි උත්තර ලකුණු කර තිබූ අවස්ථා දක්නට ලැබුණි.

1.3 වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ දී ඇති මෙම ප්‍රශ්නයට එනම් පූර්ණ තරගකාරී ආයතනයක ලක්ෂණයක් නොවන්නේ යන්න සඳහා උත්තර අංක (4) එය ප්‍රාමාණික ලාභ / සාමාන්‍ය ලාභ (normal profits) පමණක් කෙටි කාලයේදී උපයයි වෙනුවට වෙනත් උත්තර ලකුණු කර තිබුණි. කෙටිකාලීන සමතුලිතයේදී පූර්ණ තරගකාරී ආයතනයක් අධිප්‍රමාණික ලාභ ලබන අතර, දිගුකාලයේදී ලැබිය හැක්කේ ප්‍රමාණික ලාභ පමණක් බව අයදුම්කරුවන් අවබෝධ කරගත යුතුය.

1.4 නිෂ්පාදනය හා පිරිවැය පිළිබඳ සංකල්පය පිළිබඳ දැනුම මැනීමට දී ඇති ප්‍රශ්නයකි. දිගුකාලයේදී සියලුම යෙදවුම් විචල්‍ය යෙදවුම් තත්ත්වයට පත්වීමත් ස්ථාවර සේ සැලකෙන කිසිදු යෙදවුමක් නොමැති බව යන්න පිළිබඳව අවබෝධයක් නොමැති බැවින් බොහෝ අයදුම්කරුවන්ට නිවැරදිව උත්තර සැපයීමට නොහැකිවීමෙන් අවබෝධ වන්නේ මේ පිළිබඳ න්‍යායාත්මක අවබෝධය මඳ බවයි.

1.5 මෙම ප්‍රශ්නයට උත්තරය පුළුල් මුදල් සැපයුම බව බොහෝ අයදුම්කරුවන් නිවැරදිව සපයා තිබූ අතර සමහරු වැරදි උත්තරයක් වන (1) මූල්‍ය පදනම සඳහන් කර තිබුණි. පටු මුදල් සැපයුම සහ මහජනයා සතු වාණිජ බැංකුවල කාලීන සහ ඉතුරුම් තැන්පතුවල එකතුව හඳුන්වනු ලබන්නේ පුළුල් මුදල් සැපයුම ලෙස බව අයදුම්කරුවන් වටහාගත යුතුය.

1.6 වාණිජ බැංකුවක කාර්යයක් නොවන්නේ වලංගු මුදල් නිකුත් කිරීම හා කළමනාකරණය බව අයදුම්කරුවන්ගෙන් බහුතරයක්ම නිවැරදිව අවබෝධ කරගෙන ඇත. නමුත් සමහර අයදුම්කරුවන් "නොවන්නේ" වෙනුවට "වන්නේ" ලෙස අවබෝධ කරගැනීම නිසා වැරදි උත්තර තෝරාගෙන තිබුණි.

1.7 මුදල් සහ මිල මට්ටම යන සංකල්පය යටතේ මුදලට ඇති ඉල්ලුම සඳහා චේතනාවක් නොවන්නේ පිරිවැය චේතනාව ලෙස සාර්ථකව උත්තර සපයා ලකුණු ලබාගත් අයදුම්කරුවන් බහුතරයක් විය. ඔවුන්ට ඒ පිළිබඳව මනා අවබෝධයක් තිබෙන බව සාර්ථකව උත්තර සැපයීමෙන් ඔප්පු වේ.

1.8 බැංකු සහ මූල්‍ය ප්‍රතිපත්ති සංකල්පය යටතේ දී තිබූ ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්නයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති සඳහා ප්‍රමාණාත්මක පාලන උපකරණයක් හඳුනා ගැනීම සඳහා දී තිබූ ප්‍රශ්නයට සමහර අයදුම්කරුවන් (1) සහ (4) වරණ තෝරා ගන්නා ලද්දේ ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර ගැනීමකින් තොරව බව පෙනේ. එහෙත් නිවැරදි වරණය වන (3) බැංකු පොලී ප්‍රතිපත්තිය ලෙස උත්තර සැපයූ අයදුම්කරුවන් සැහෙන ප්‍රමාණයක් සිටින ලදී.

1.9 වාණිජ බැංකුවක අරමුණු යටතේ (1) සහ (4) වරණ වැරදි සහගත ලෙස සමහර අයදුම්කරුවන් තෝරාගෙන තිබුණි. මේ සම්බන්ධව විෂය අනුබද්ධ දැනුම ප්‍රමාණවත්ව නොමැති බව පෙනේ. ඉතාමත් සුළු අයදුම්කරුවන් කොටසක් (2) වරණය වන "ද්‍රවශීලතාවය සහ ලාභදායිත්වය" යන නිවැරදි වරණය තෝරාගෙන තිබුණි.

1.10 ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව 2016 ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම පිළිබඳව ප්‍රායෝගික දැනුම පරීක්ෂා කරන ප්‍රශ්නයක් වුවද අයදුම්කරුවන් බොහෝ දෙනෙක් මහබැංකු වාර්තාව වැනි විෂය අනුබද්ධ පොත්පත් පරිශීලනය කිරීම අවම බව පෙනී යන්නේ වරණ (2) සහ (3) උත්තර නිවැරදි ලෙස ඉදිරිපත් කිරීම නිසාය. නිවැරදි උත්තරය ලෙස වරණ අංක (4) උත්තරය ලියූ අයදුම්කරුවන් සිටියේ ඉතා අල්ප සංඛ්‍යාවකි.

**1.11 - 1.15** දක්වා දෙනලද ප්‍රකාශයන්හි සත්‍ය අසත්‍යතාවය සටහන් කිරීම තුලින් නිවැරදි උත්තරය තෝරා ගත යුතුව ඇත. සමස්තයක් ලෙස ගත්කල මෙම ප්‍රශ්නවලට උත්තර සැපයීම සාර්ථකව තිබුණත් අයදුම්කරුවන් වැඩි ප්‍රමාණයක් **1.12** සහ **1.14** යන ප්‍රශ්නවලට වැරදි උත්තර සපයා තිබුණි. **1.12** ප්‍රශ්නය වන ආන්තික පිරිවැය පිළිබඳ ප්‍රශ්නය පිළිබඳව න්‍යායාත්මක අවබෝධයක් නොමැතිව එයට "සත්‍ය" ලෙස වැරදි උත්තර සැපයීමටත්, ආන්තික පිරිවැය සහ ආන්තික අයභාරය පිළිබඳව අසන ලද **1.14** වන ප්‍රශ්නයට උත්තරය සඳහා "අසත්‍යය" කියා වැරදි උත්තර සපයා තිබුණි. මෙයින් පෙනෙන්නේ පිරිවැය සංකල්පය පිළිබඳ දැනුම හා පොත්පත් අධ්‍යයනය ඉතා අවම බවයි.

**1.16 - 1.20** දක්වා ප්‍රශ්නවලට දෙනලද උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගත යුතුව ඇත. **1.16, 1.17** සහ **1.20** ප්‍රශ්න සඳහා අයදුම්කරුවන් බොහෝ දෙනෙකු නිවැරදි උත්තර සපයා තිබුණි. වෙළෙඳපොළ නිෂ්පාදන හා පිරිවැය සංකල්පය සහ ආර්ථික වර්ධනය ගැන දැනුම මැනීමට මෙම ගැටළු මගින් අපේක්ෂා කෙරේ. අඩු දැනුම සහ අවබෝධය නිසා **1.18** සහ **1.19** කොටස් සඳහා ලකුණු ලබා ගැනීමට සමහර අයදුම්කරුවන්ට නොහැකි විය.

**1.18** ප්‍රශ්නයේදී භාණ්ඩයක සමතුලිත මිල සහ සැපයුම්කරු විකිණීමට සූදානම් මිල අතර වෙනස නිෂ්පාදන අතිරික්තය වුවත් සැළකිය යුතු අයදුම්කරුවන් පිරිසක් වැරදි සහගත අයුරින් එය පාරිභෝගික අතිරික්තය ලෙස හඳුනාගෙන තිබුණි.

**1.19** ප්‍රශ්නය තුලින් අවශ්‍ය වී තිබුණේ 2015 වර්ෂය සඳහා සහ 2016 වර්ෂය සඳහා සපයා තිබූ දත්ත පදනම් කරගෙන 2016 වර්ෂය සඳහා ආර්ථික වර්ධන අනුපාතිකය ගණනය කිරීමයි. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් නිවැරදි උත්තරය වන 4% වෙනුවට 2% ලෙස සටහන් කොට තිබුණි.

## B කොටස

එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.

### ප්‍රශ්න අංක 02 - ලකුණු 10

(a) මෙම ප්‍රශ්නය නිෂ්පාදන සාධක (ආර්ථික සම්පත්) පිළිබඳ දැනුම පරීක්ෂාවට ලක්කෙරෙන ප්‍රශ්නයකි. බහුතර අයදුම්කරුවන් ප්‍රමාණයක් නිෂ්පාදන සාධක හතර (4) නිවැරදිව දක්වා පැහැදිලි කිරීම් කර ඇත. ඔවුන් මුළු ලකුණු ප්‍රමාණය ලබාගෙන ඇතත් සමහර අයදුම්කරුවන් නිෂ්පාදන සාධක (4) පමණක් සඳහන් කර විස්තර කර නොමැතිවීමෙන් සම්පූර්ණ ලකුණු ලබාගැනීමට අපොහොසත් වී ඇත. සුළු අයදුම්කරුවන් සංඛාවකට ප්‍රාග්ධනය යන්න පිළිබඳව නිවැරදිව විස්තර කිරීමට අපොහොසත් වී තිබුණි.

(b) දෙනලද සංඛ්‍යා භාවිත කරමින් ඉල්ලුම් සැපයුම් සමීකරණ දෙක විසඳා භාණ්ඩයේ සමතුලිත මිල රු.30/- ක් හා සමතුලිත ප්‍රමාණය ඒකක 40 ලෙසත් නිවැරදිව විසඳා තිබුණි. සුළු අයදුම්කරුවන් පිරිසකට මෙම සමීකරණ විසඳා සමතුලිත මිල සොයා ගැනීමටත් සමතුලිත මිල ආදේශ කිරීම මගින් සමතුලිත ප්‍රමාණය ගණනය කර ගැනීමට පවා දැන නොසිටි බව පෙනේ. පහසුවෙන් සහ ලකුණු සම්පූර්ණයෙන් ලබාගත හැකි ලෙහෙසි ප්‍රශ්නයක් ලෙස මෙම ප්‍රශ්නය සැළකිය හැක.

### ප්‍රශ්න අංක 03

(a) "හීනවන ආන්තික උපයෝගිතා න්‍යාය" යනු කුමක්දැයි උදාහරණ සහිතව පැහැදිලි කිරීමක් මෙමගින් අපේක්ෂා කෙරුණි. සෑම වර්ෂයකම වාගේ පාරිභෝගික හැසිරීම පිළිබඳව අයදුම්කරුවන්ගේ න්‍යායාත්මක දැනුම පිරික්සීමට මෙවැනි ප්‍රශ්නයක් ඉදිරිපත් වුවද අයදුම්කරුවන් නිවැරදිව උත්තර සපයා නොමැත. එහෙත් අයදුම්කරුවන් හරිහැටි අධ්‍යයනය කර තිබුණේනම් මෙම ප්‍රශ්නයට පහසුවෙන් උත්තර සැපයිය හැකිව තිබුණි. එහෙත් උත්තර සැපයූ අයදුම්කරුවන්ගේ උත්තර දෙස බැලීමෙන් පෙනී යන්නේ බොහෝ දුරට අඩු ලකුණු සහ ලකුණු ශුන්‍ය වන අවස්ථාවන්ය. මුළු උපයෝගිතාවය හීනවන අනුපාතිකයකින් වැඩිවන විට, ආන්තික උපයෝගිතාවය ධනාත්මක වුවද, ආන්තික උපයෝගිතාවය හීනවන බව නිවැරදිව දක්වා තිබුණේ අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවකි. සමහර අයදුම්කරුවන් හීනවන ආන්තික උපයෝගිතා න්‍යාය සඳහා උදාහරණ දැක්වීමට අපොහොසත් වී තිබුණි.

(b) අයදුම්කරුවන්ට පහසුවෙන්ම උත්තර ලිවිය හැකි ප්‍රශ්නයකි. ඉල්ලුම කෙරෙහි බලපාන සාධක 4 ක් පිළිබඳව නිවැරදිව උත්තර සපයා සම්පූර්ණ ලකුණු 4 ම ලබාගත් අයදුම්කරුවන් බහුතරයකි. සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් කරුණු 3 ක් හෝ 2 ක් පමණක් උත්තර ලෙස ලියා තිබුණි. සමහර අයදුම්කරුවන් ඉල්ලුම කෙරෙහි බලපාන සාධක වෙනුවට නිෂ්පාදන සාධක සඳහා දැරිය යුතු පිරිවැය, නිෂ්පාදකයින්ගේ අපේක්ෂාවන් වැනි සැපයුම සඳහා බලපාන සාධක වැනි අදාල නොවන උත්තර දක්වා තිබුණි.

### ප්‍රශ්න අංක 04

(a) රාජ්‍ය අයවැය ලේඛනයක ප්‍රධාන ලක්ෂණ පිළිබඳව විමසීමක් මේ යටතේ සිදුකර ඇත. බොහෝ අයදුම්කරුවන් අයවැය ලේඛනයක වැය ශීර්ෂයන් ගැන පමණක් ලියා තිබීමත්, බදු මත අයවැය ලේඛනය රඳා පවතින අයුරුත්, හිඟ අයවැය ලේඛනයක් පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමටත් ඉදිරි වර්ෂයක් සඳහා සකස් කෙරෙන ලේඛනයක් ලෙස තේරුම් නොගෙන පෙර වර්ෂයේ අයවැය වාර්තාවක් ලෙසත් ආදී වශයෙන් අනවබෝධයකින් යුතුව කරුණු ඉදිරිපත් කර ඇත.

නවත් සමහර අයදුම්කරුවන් මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳවත් පොලී අනුපාත තීරණය වීම පිළිබඳවත් මෙම වසරට අදාල ආදායම් වියදම් පෙන්වන ලේඛණයක් ලෙසත් වැරදි පැහැදිලි කිරීම් කර ඇත. සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සමත්වූයේ අයදුම්කරුවන්ගෙන් අඩක් පමණ පිරිසකටය.

(b) රජයක් විසින් වක්‍ර බද්දක් ලෙස භාණ්ඩයක් සඳහා ඒකක බද්දක් පැනවීමේ ප්‍රතිවිපාක පිළිබඳව විමසූ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් ලියූ උත්තර බොහොමයක්ම අසාර්ථක වී ඇත. බදු පැනවීම මගින් ආර්ථිකය තුළ ඇතිවිය හැකි ඉල්ලුම අඩුවූ වීම මිල ඉහළයාම, රජයේ බදු ආදායම වැඩිවීම ආදී ප්‍රධාන නොවන කරුණු ඉදිරිපත් කළද, බද්දෙන් පසු මූලිකවම සැපයුම් වක්‍රය වමට විතැන්වීම පිළිබඳව ලියූ අයදුම්කරුවන් ප්‍රමාණය අල්පය.

සමහර අයදුම්කරුවන් ප්‍රස්ථාරය නිවැරදිව ඇඳ නම්කොට තිබුණද, ඒ පිළිබඳ පැහැදිලි කිරීම් කර නොතිබුණි. තවත් සමහර අයදුම්කරුවන් බදු වර්ග කර බදු විතැන් කිරීම ගැන ලියා තිබුණද බද්දක් පැනවීමේ ප්‍රතිවිපාක මොනවාදැයි පැහැදිලි කර නොතිබුණි. බොහෝ අයදුම්කරුවන්ට උත්තර නිසිලෙස ඉදිරිපත් කිරීමට නොහැකි වූ ප්‍රශ්නයක් ලෙස සැලකිය හැක. මේ පිළිබඳව අයදුම්කරුවන්ගේ අවබෝධය ඉතාමත් අඩුබව කිවයුතු අතර, ලබාගතයුතු මුළු ලකුණු ප්‍රමාණයම ලබාගත්තේ ඉතා සුළු ප්‍රමාණයකි.

## ප්‍රශ්න අංක **05**

(a) අන්තර්ජාතික වෙළඳාමේ මූලික සංකල්ප පිළිබඳව කියවෙන මෙම ප්‍රශ්නයෙන් අසා ඇත්තේ සාපේක්ෂ වාසිය සහ නිරපේක්ෂ වාසිය පිළිබඳ වෙනස පිළිබඳවයි. මෙම ප්‍රශ්නයට අඩුවෙන් ලකුණු ලබාගත් අයදුම්කරුවන් බහුතරයකි. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට අසාර්ථක ලෙස උත්තර ලියා තිබුණි. සමහර අයදුම්කරුවන් නිරපේක්ෂ වාසිය සහ සාපේක්ෂ වාසිය පටලවාගෙන උත්තර ලියා තිබුණි.

කිසියම් රටකට යම්කිසි භාණ්ඩයක් නිපදවීමෙහිලා සාපේක්ෂ වාසි තිබේද යන්න හඳුනාගත හැක්කේ ඒ ඒ භාණ්ඩය නිපදවීමෙහිලා තවත් රටකට වඩා අඩු ආවස්ථික පිරිවැයකට යම්කිසි රටකට භාණ්ඩ සහ සේවා නිපදවීම කළ හැකිවීම මගින් යනුවෙන් නිවැරදිව උත්තර සපයා තිබුණේ අයදුම්කරුවන් අතරින් ඉතාමත් ස්වල්ප දෙනෙකි. නිරපේක්ෂ වාසිය යනු භාණ්ඩයක හෝ සේවාවක ඒකකයක් ලෝකයේ වෙනත් රටක නිෂ්පාදනය කරන පිරිවැයට වඩා අඩු පිරිවැයකට නිෂ්පාදනය කිරීමට යම්කිසි රටකට ඇති හැකියාව බව අයදුම්කරුවන් අවබෝධ කර ගත යුතුය.

(b) ජාත්‍යන්තර වෙළඳාමේ අවාසි 3 ක් පැහැදිලි කිරමට අසා ඇති මෙම ප්‍රශ්නයේ මුළු ලකුණු ලබාගත්තේ අඩු අයදුම්කරුවන් ප්‍රමාණයකි. වැඩි අයදුම්කරුවන් ප්‍රමාණයක් ලබාගෙන ඇත්තේ ලකුණු 2 ක් හෝ ලකුණු 4 ප්‍රමාණයකි. රටතුලට මත්ද්‍රව්‍ය ගෙනඒම, යුධ කටයුතු ගැන රටේ කර්මාන්ත ආරක්ෂා කර ගැනීමට නොහැකිවීමත් ආනයන තුලින් රටේ මුදල් ඇදීයාම යනාදි ලෙස පොදු කරුණු ලියා තිබුණි. ආර්ථිකයට අහිතකර භාණ්ඩ රට තුලට ගෙනඒම, අවශ්‍ය ප්‍රමාණයටත් වඩා විශේෂීකරණය වීම කිසියම් රටක් අනෙක් රටවල් මත රඳා පැවතීම, රටවල් අතර තරඟකාරීත්වය වැඩිවීම, දේශීය ළදරු කර්මාන්ත පිරිහීම ආදී නිශ්චිත කරුණු ගැන අයදුම්කරුවන්ට පැහැදිලි කිරීමට නොහැකි වූයේ හරිහැටි අධ්‍යයනය කර නොතිබීම බව පෙනී යයි.

## <u>C කොටස</u>

## ප්‍රශ්න අංක **06**

(A) මෙය ජාතික ගිණුම්කරණයට අයත් ප්‍රශ්නයකි. ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල වර්ෂයක කාල සීමාවක් සඳහා උපකල්පිත දත්ත ඉදිරිපත් කර එමගින් ගණනය කිරීම් කළ යුතුව ඇත.

(a) දළ දේශීය වියදම ගණනය කළ යුතුව ඇත. බොහෝ අයදුම්කරුවන් මෙම කොටස සඳහා වෙන්කොට තිබූ සම්පූර්ණ ලකුණු ලබා ගන්නා ලදී. සමහර අයදුම්කරුවන් දත්ත වලින් කොටසක් පමණක් යොදා ගැනීම නිසා මුළු ලකුණු අහිමි වූ අතර, එකතුකිරීමේ දෝෂ වැනි ගණිතමය දෝෂ නිසාද සමහර අයදුම්කරුවන්ට ලකුණු අහිමි විය. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් දළ දේශීය වියදම ගණනය කිරීමේදී දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය නොසළකා හැර තිබුණි.

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී ශුද්ධ අපනයන දත්ත ගැළපීමට සමහර අයදුම්කරුවන් අපොහොසත් විය. සමහර අයදුම්කරුවන් අදාල සංකල්ප සඳහා ගැළපිය යුතු දේ පටලවාගෙන සංකල්ප මාරුකර ගළපා ඇත.

(c) වෙළෙඳපොළ මිලට ජාතික නිෂ්පාදිතය ගණනය කිරීමට අවශ්‍ය විය. සමහර අයදුම්කරුවන් විසින් වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතයට විදේශීය ශුද්ධ සාධක ආදායම එකතු කිරීම වෙනුවට එය අඩුකිරීම නිසා මෙම කොටසේ උත්තර වැරදි සහගත විය.

(d) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතයට ප්‍රාග්ධන ක්ෂයවීම් අඩු කිරීමෙන් වෙළෙඳ පොළ මිලට ශුද්ධ ජාතික නිෂ්පාදිතය ලබාගත යුතු අතර, සමහර අයදුම්කරුවන් වැරදි සහගත ලෙස ප්‍රාග්ධන ක්ෂයවීම් එකතුකිරීම නිසා උත්තර නිවැරදි නොවිය. එහෙත් බොහෝ අයදුම්කරුවන් මෙම ගැලපීම් නිවැරදි ලෙස ගලපා තිබුණි.

(a), (b), (c) සහ (d) කොටස් හතරටම නිසිලෙස ගලපා නිවැරදි උත්තර ලබාගත් අයදුම්කරුවන් සිටි අතර, අසාර්ථකව උත්තර සැපයූ අයදුම්කරුවන්ට එසේ වීමට හේතු වී ඇත්තේ මෙවැනි ගැටළුවලට විසඳුම් සෙවීමේ පළපුරුද්ද නොමැතිකම නිසාය. ජාතික වියදම සම්බන්ධයෙන්, E = C+I+G+(X-M) යන සමීකරණය පිළිබඳව නිසි අවබෝධයක් සමහර අයදුම්කරුවන්ට නොමැත. මේ අනුව ක්‍රමානුකූලව පියවරෙන් පියවර දත්ත ගලපා මුළු ලකුණු 10 ම ලබාගත් අයදුම්කරුවන් ද සිටින ලද අතර, විෂය කරුණු නිසිලෙස පරිශීලනය කළ අයදුම්කරුවන්ට පහසුවෙන්ම වැඩි කාලයක් ගතනොකර ලකුණු ලබාගත හැකි ප්‍රශ්නයක් වේ.

(B) ෆිස්කල් ප්‍රතිපත්තිය අර්ථ දක්වා ෆිස්කල් ප්‍රතිපත්ති උපකරණවලට උදාහරණ සහිතව උත්තර සැපයීමට දී ඇත. බොහෝ අයදුම්කරුවන් නිවැරදි අවබෝධයක් නොමැතිකම නිසා ප්‍රශ්නය ආරම්භයේ දී ඇති මූල්‍ය ප්‍රතිපත්තිය සහ ෆිස්කල් ප්‍රතිපත්තිය පටලවාගෙන ඇත. නිසි පරිදි විෂය කරුණු අධ්‍යනය නොකිරීම නිසා මෙසේ විෂය කරුණු පටලවාගෙන ඇත. අයදුම්කරුවන් අතරින් ස්වල්ප පිරිසක් නිවැරදිව උත්තර සපයා මුළු ලකුණු ලබා ගැනීමට සමත් වී ඇත.

(C) (a) ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය පිළිබඳව අසා ඇති අතර බොහෝ අයදුම්කරුවන් මෙම කොටසට සාර්ථකව උත්තර සපයා තිබුණි. සමහර අයදුම්කරුවන් ප්‍රශ්නයට පෙර දී ඇති ප්‍රකාශය තුළ පිරිවැයෙන් තල්ලුවුනු උද්ධමනය ගැන සඳහන් කර ඇති බැවින් පිරිවැයෙන් තල්ලුවුනු උද්ධමනය ගැනද පවසා ඇත. මීට හේතුව අයදුම්කරුවන් ප්‍රශ්නය පැහැදිලිව කියවා අවබෝධ කර නොගැනීමයි.

(b) උද්ධමනය අඩුකිරීම සඳහා රටක් විසින් ගතහැකි පියවරයන් පිළිබඳව සමහර අයදුම්කරුවන් නිසි අයුරින් උත්තර සපයා නොතිබුණි. ඍජු බදු වැඩියෙන් අයකිරීම, රජයේ වියදම් කපා හැරීම, මිල පාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, නිෂ්පාදන සහනාධාර දීම යනාදී කරුණු අයදුම්කරුවන් විසින් සාර්ථක ලෙස ඉදිරිපත් කර තිබුණේ ඉතා සුළු වශයෙනි. සමහර අයදුම්කරුවන් නිෂ්පාදන බද්දක් අයකිරීම, මුදල් සැපයුම වැඩිකිරීම වැනි වැරදි උත්තර සපයා තිබුණි. මේ සම්බන්ධයෙන් අවබෝධය අවම මට්ටමක පවතින බව ඔවුන් සැපයූ උත්තර මගින් නිගමනය කළ හැක.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු</u>:**

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

3. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

4. මෙම විෂයට අදාල ස්ව-අධ්‍යයන පාඩම්මාලාව, ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, මහ බැංකු වාර්තා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

5. උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

6. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

7. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

8. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

9. ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

10. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

11. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

12. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

**- * * * -**